# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2208/27 - 2020 දෙසැම්බර් මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2020.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක : 74.

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(ආ)(ii) වගන්තිය යටතේ විශේෂ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(ආ)(ii) වගන්තිය යටතේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියා කරමින්, අත් පිරිසිදුකාරක සනීපාරක්ෂක (Hand Sanitizers) ආනයනකරුවකු, නිෂ්පාදකයින්, බෙදාහරින්නන්, වෙළෙඳුන් විසින් අදාළ අත් පිරිසිදුකාරක ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි කර අදාළ ලියාපදිංචි අංකය සියලු අත් පිරිසිදුකාරක සනීපාරක්ෂක ඇසුරුම්වල හෝ බහාලුම්වල ප්‍රකටව පෙනෙන ආකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස අත් පිරිසිදුකාරක සනීපාරක්ෂක කිසිවක් ආනයනය කිරීම, නිෂ්පාදනය, ගබඩා කිරීම, බෙදාහැරීම හෝ තොග හෝ සිල්ලර වශයෙන් විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

මෙම විධානය වර්ෂ 2021 පෙබරවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

**මේජර් ජෙනරාල් ශාන්ත දිසානායක (විශ්‍රාමික),**
සභාපති.

2020 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

01 - 136

1A - PG 5179 — 220 (2020/12)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*